පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

| | | |
|---|---|---|
| | සතිය - 01 | සැකසුම - තමාලි පරණගම |
| විෂය - චිත්‍ර කලාව | ශ්‍රේණිය - 6 | මාවනැල්ල අධ්‍යාපන කලාපය |

**නිපුණතාවය : 6 ආගමික හා සංස්කෘතික අංග දෙස් විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කෘතීන්, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජන මාධ්‍ය ඇසුරෙන් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදනයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනී.**

**නිපුණතා මට්ටම : 6.1 තෝරාගත් ආගමික හා ජාතික උත්සව අවස්ථාවන්හි දක්නට ලැබෙන කලාත්මක අංග රසාස්වාදය කරයි.**

**පාඩම : 6.1.4 නත්තල් උත්සවය හා බැඳි නිර්මාණ අගයමු.**

- "නතාල" නැමැති පෘතුගීසි වචනයෙන් බිඳී ආ නත්තල යන වචනයෙන් උපත යන අර්ථය ලබා දේ. ලතින් භාෂාවේ ද "නතාලිස් " යන්නෙහි අර්ථය වන්නේ උපත යන්නයි.
- ලෝකය පුරා සිටින ක්‍රිස්තියානි බැතිමත්හු ජේසු බිළිඳාගේ උපන් දින නත්තල ලෙසින් උත්සවාකාරයෙන් සමරති.
- ජේසුස් වහන්සේ යනු මනුෂ්‍යාත්වය ලබාගත් දේව පුත්‍රයා වේ.
- ජේසුස් වහන්සේ මනුෂ්‍යයෙක් ලෙස ඉපදීම සැමරීම සඳහා නත්තල් උත්සවය පවත්වනු ලබයි.
- ජේසුස් වහන්සේ සාමයේ කුමාරයාණන් ලෙස සලකනු ලැබේ.
- ජේසුතුමාගේ මව මරිය මව්තුමිය වන අතර උන්වහන්සේ සුරැකි පියා වන්නේ ජුසේතුමාණන් වේ.
- දෙසැම්බර් මස 24 වන දින මධ්‍යම රාත්‍රියේ ජේසුස් වහන්සේ උපන් බවට පිළිගැනේ.



- ජන සංගණනයකට සහභාගී වීම සඳහා "බෙත්ලෙහෙමට" පැමිණි අවස්ථාවේ ගව ලෙනක් තුළ දී ජේසු බිළිඳාගේ උත්පත්තිය සිදු වූ බව පිළිගැනේ.
- උන්වහන්සේගේ දේශනයන් හා ප්‍රාතිහාරයන් ද සබත් දිනය නීති රීති කැඩීම හේතුවෙන් ජුදා නායකයින් උන්වහන්සේට විරුද්ධව නැගී සිටි අතර උන්වහන්සේ කුරුසයේ තබා ඇණ ගසා එල්ලා මරා දමන ලදී.
- සෑම වසරකම දෙසැම්බර් 24 මධ්‍යම රාත්‍රියේ දේවස්ථානවලට රැස්වන කිතුනු බැතිමත්හු නත්තල උසවශ්‍රීයෙන් පවත්වනු ලබති.

## ***නත්තල් සැරසිලි හා විශේෂ ක්‍රියාකාරකම්***

නත්තල් ගස සැරසීම



නත්තල් නාට්‍ය



ගව ලෙන සෑදීම



**නත්තල් උත්සවය**





නත්තල් ගීත ගායනය

නත්තල් කේක සෑදීම






නත්තල් සුභපැතුම්පත්

නත්තල් සීයා

**ක්‍රියාකාරකම : පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. නත්තල් උත්සවය පැවැත්වීමේ අරමුණ කුමක්ද?

02. නත්තල් උත්සව කාලයේ සිදුවන යහපත් ක්‍රියා දෙකක් නම් කරන්න.

03. නත්තල් සැරසිලි සඳහා භාවිතා වන අමුද්‍රව්‍ය 05ක් නම් කරන්න.

04. නත්තල් උත්සවය හා බැඳි ඇති සැරසිලි නිර්මාණ දෙකක් නම් කරන්න.

05. නත්තල් සුභපැතුම් පතක් නිර්මාණය කරන්න.